" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/PTR/ 12-3/FI/5
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2020.03.04

ලේකම්,

පළාත් පාලන අමාත්‍යාංශය,

බස්නාහිර පළාත.

පළාත් පාලන කොමසාරිස්

බස්නාහිර පළාත.

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි(යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක සිඑම්/ඩබ්පි/ඒඩිඑම්/10/01/1-68 හා 2019.12.05 දිනැති ලිපිය හා බැඳේ.

02. බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2020.02.26 දිනැතිව අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි(යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පිටපතක් මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

එච්.ඩී.පී.ජයරත්න,

පරිපාලන නිලධාරි,

ප්‍රධාන ලේකම් වෙනුවට(බ.ප.)

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) තනතුරට
බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

1. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

යොමු අංකය : LGD/2/21/03/19

දිනය : 2019.12.02

1.2 අමාත්‍යාංශය : පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.)

යොමු අංකය : CMWP/APM10/01/1-68

දිනය : 2019.12.

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :

යොමු අංකය :DMS/D/පොදු 11-2

දිනය : 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්(බ.ප.) නිර්දේශය:

යොමු අංකය : CSWP/PTR/12-3/FI/5

දිනය : 2019/12/12

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය -

යොමු අංකය : ..........................................

දිනය : ..........................................

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය

යොමු අංකය : WPC/PSC/MNP/01/04/183

දිනය : 2020/01/24

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

යොමු අංකය : ..........................................

දිනය : ..........................................

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
යොමු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

2. පත්කිරීම් බලධරයා : පුහුණු කිරීමේ ශ්‍රේණිය, III ශ්‍රේණිය, II ශ්‍රේණිය, I ශ්‍රේණිය සහ විශේෂ ශ්‍රේණිය - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ක්‍රියාත්මක වන දිනය :

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් අංක 1930/12 හා 2015.09.01 දිනැති ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට සමගාමීව 2013 ජුනි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

3. සේවා ගණ පිළිබඳ විස්තර :

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය

3.1 ශ්‍රේණි III ශ්‍රේණිය

II ශ්‍රේණිය

I ශ්‍රේණිය

විශේෂ ශ්‍රේණිය

3.2 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය :

විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳව පුහුණුව ලබා ගත යුතු, ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන්නා වූ මූල්‍ය, මානව, භෞතික,ද්‍රව්‍යමය,තාක්ෂණික දත්ත හා සම්පත් අධීක්ෂණය, මෙහෙයවීම හා කළමනාකරණය යන කාර්යයන් ඇතුලත් බහුකාර්යය ස්වරූපයෙන් යුත් අර්ධ වෘත්තීය සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්ලත් හා පුහුණුව හා පළපුරුද්ද මත, කළමනාකරණ සේවාවක් වන ඉංජිනේරු සේවයට පරිපූරක වන්නා වූ කාර්යයන් ඉටුකරන සේවා ගණයකි.

3.3 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යය අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවයද, කුසලතාවයද පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

4. තනතුරෙහි ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

5. වැටුප් :

5.1 වැටුප් කේත අංක : III, II, I ශ්‍රේණි - රා.ප.ච. 03/2016 - MN 03 – 2016
විශේෂ ශ්‍රේණි - රා.ප.ච. 03/2016 - MN 07 – 2016

5.2 වැටුප් පරිමාණය : III,II,I ශ්‍රේණි- රු.31,040/-10x445- 11 x660 -10x730- 10 x 750 - රු.57,550/-
විශේෂ ශ්‍රේණිය - රු.41580/- - 11x 755 – 18x 1030 - රු. 68,425/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| III | 1 | රු. 31,040/- |
| II | 12 | රු. 36,150/- |
| I | 23 | රු. 43,480/- |
| විශේෂ | 04 | රු. 43,845/- |

සටහන : බඳවා ගැනීම්, උසස් කිරීම්වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණ සඳහන් කිරීමේදී අංක 03/2016 චක්‍රලේඛයේ උපලේඛණ I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කල යුතුය. එහෙත් ගෙවීම් කල යුත්තේ, උපලේඛණ II හි සඳහන් පරිදි බැව් පත්වීම් ලිපියෙහි සඳහන් කල යුතුය.

5.4 පුහුණු කිරීමේ ශ්‍රේණියේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව දීමනාව:

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛණ V හි සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබේ.



ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

06. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, තනතුර අනුමත ශ්‍රේණි, අනුමත තනතුරු සංඛ්‍යාව හා කාර්යයන්.

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| තාක්ෂණ නිලධාරී(යාන්ත්‍රික) (තනතුර අනුමත ආයතන හා අනුමත තනතුරු සංඛ්‍යාව - ඇමුණුම 1 හි දක්වා ඇත.) | III/II/I<br><br>විශේෂ | 43<br><br>02 | නඩත්තු අංශය:-<br>වාහන යන්ත්‍ර (BachoeLoader,crew,excavator,Doazer,Dumper,Road Roller,Motor grader ආදිය) හා උපකරණවල යාන්ත්‍රික හා විදුලි දෝෂ හඳුනාගැනීම, අමතර කොටස් සපයා දීම, අලුත්වැඩියාවට යොමු කිරීම, වැඩ අධීක්ෂණය හා තත්ත්ව පරීක්ෂාව<br>නිෂ්පාදන අංශය:-<br>• නව ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් සඳහා අදාල ඇස්තමේන්තු සැකසීම<br>• අමුද්‍රව්‍ය හා උපකරණ සපයා දීම<br>• වැඩ පැවරීම හා අධීක්ෂණය<br>• තත්ත්ව පරීක්ෂාව |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්කිරීමේ කාර්යය සඳහා III, II, I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ. ඉන් පරිබාහිරව විශේෂ ශ්‍රේණිය සඳහා සේවා අවශ්‍යතාවය අනුව අනුමත සේවක සංඛ්‍යාවක් වෙනම පැවතිය හැකිය.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාල නොවේ. |

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: ගආ/ADM/4/7/307
දිනය: 2020.02.26

සටහන: I. III, II, I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය තුල නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කරගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව 03 ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

7.2 විවෘත බඳවා ගැනීම.

7.2.1 බඳවාගන්නා ශ්‍රේණිය

7.2.1.1 පුහුණු ශ්‍රේණිය : ( දෙවසරක පුහුණු කාලය)

(අ) අධ්‍යාපන සුදුසුකම් -

අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂයධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේද තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම.

සහ

සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

7.2.1.2 පුහුණු ශ්‍රේණිය : (එක් වසරක පුහුණු කාලය)

(අ) අධ්‍යාපන සුදුසුකම්

අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂයධාරාව යටතේයාන්ත්‍රික තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම.

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම්

(I) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක යාන්ත්‍රික ක්ෂේත්‍රයේ වසර 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය (යාන්ත්‍රික) ලබා තිබීම.

හෝ

(II) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක යාන්ත්‍රික ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ වසර 02 ක ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබිම.

හෝ

(III) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**සටහන:**

(I) III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වන ශ්‍රේණියට පළමුව බඳවා ගත යුතුය.

(II) III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලැබේ.



ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: ඉ05/ADM/4/7/309
දිනය: 2020.02.26

(III) පුහුණු ශ්‍රේණිය එක් වසරක පුහුණු කාලය හා දෙවසරක පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ලකුණු පදනම් කර ගනිමින් III ශ්‍රේණියට පත් කිරීමේදී ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබයි.

7.2.1.3 III වන ශ්‍රේණිය(විවෘත)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම්

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික(යාන්ත්‍රික) ඩිප්ලෝමාව.

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (යාන්ත්‍රික)

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික)

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික)

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2. කායික සුදුසුකම්

බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.3. වෙනත්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (3) තුළ බස්නාහිර පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරහ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.2.4. වයස :

7.2.4.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.4.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

7.2.5 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරහ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වුවහොත් පමණක් පවත්වනු ලැබේ.

7.2.5.1 ලිඛිත විභාගය

7.2.5.1.1 පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව) සඳහා

| විෂයය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |

7.2.5.1.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව) සඳහා

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

( විෂය නිර්දේශය - උපලේඛණ 01)

7.2.5.1.3 පවත්වන බලධරයා -

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5.2 වෘත්තිය පරීක්ෂණ - අදාල නොවේ.

7.2.5.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :- ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.2.5.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.2.6 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඊට අමතරව වෙබ් අඩවියේද දැන්වීම් පළ කළ හැකිය.



ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

**7.3 සීමිත බඳවා ගැනීම.**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :

7.3.1.1 පුහුණු කිරීමේ ශ්‍රේණිය : ( දෙවසරක පුහුණුව සඳහා)

(අ) අධ්‍යාපන සුදුසුකම්

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.

(ආ) පළපුරුද්ද

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.1.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය : (එක් වසරක පුහුණුව සඳහා)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමල/ඉංග්‍රිසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.

(ආ) වෘත්තීය සුදුසුකම්

තනතුරට අදාළව 7.2.1.2 (ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 5 ක පළපුරුද්ද

(ඇ) පළපුරුද්ද

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.1.3 III වන ශ්‍රේණිය (ඍජු බඳවා ගැනීම)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.

(ආ) වෘත්තීය සුදුසුකම්

තනතුරට අදාළව 7.2.1.3(ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

(ඇ) පළපුරුද්ද

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.2 කායික සුදුසුකම්

බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.3 වෙනත්

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

II. නියමිත දිනට පූර්වාසන්නව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තුගත ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර පහක(05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.



ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: ගිWS/ADM/4/7/309
දිනය: 2020.02.26

III.සේවයට බඳවාගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.ලිඛිත විභාගය පුරප්පාඩු සංඛ්‍යාවකට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වුවහොත් පමණක් පවත්වනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

( විෂය නිර්දේශය - උපලේඛණ 01)

7 .3.4.1.1 පවත්වන බලධරයා :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :- ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත්කරනු ලබන බලධරයා -

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.5 පුහුණු කාලසීමාව අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගැනීම.

(අ) විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. (විෂය නිර්දේශය - උපලේඛණ 02)

(ආ) විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ දෙවසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කරගනු ලබන අයදුම්කරුවන් ඉහත (අ) සඳහන් විභාගය සමත්වීමෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමට පෙර 7.2.1.2 (ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබිය යුතුය.

(ඇ) පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත.

එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කල ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලබන අතර සීමිත ධාරාව යටතේ අයදුම්කල ආධුනිකයන් ඔවුන්ගේ පූර්ව තනතුරුවලට මුදාහැරේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

සටහන : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයෙහි viii පරිච්ඡේදයේ 92 වන වගන්තියෙහි විධිවිධාන අදාළ වේ.

(ඇ) සීමිත ධාරාව යටතේ තෝරාගත් ආධුනිකයින් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වන විභාගය සමත්වන තුරු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ බඳවා ගැනීම් ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ.

පුහුණු කාලසීමාව සතුටුදායක ලෙස ගත කරන නිලධාරියෙකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහල වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත්වීමෙන් පසු 2000.03.02 දිනැති අංක 07/2000 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම් විභාග :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකටද පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) III ශ්‍රේණියට බඳවාගත් දින සිට වසර තුන(03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛණය 03) |
| II වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛණය 04) |
| III වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) I ශ්‍රේණියට උසස් වී වසර(05) ක් ගතවීමට පෙර | කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද:

වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

(අ) පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබයි.

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: WPS/ADM/4/7/309
දිනය: 2020.02.26

(ආ) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවකි.

සටහන : මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

**09. භාෂා ප්‍රවීණතාව :**

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස.(සා/පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවක් III වන ශ්‍රේණියේ වසර 5ක් ඉක්මවීමට පෙර ලබා ගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම :**

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය හා සන්ධාන භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

VI. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම - II) අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: G05/ADM/4/7/309
දිනය: 2020.02.26

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්.

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.2.1.2 උසස්වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම - II) අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සටහන : සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධරයන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

10.3 විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම.

10.3.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| සීමිත | 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතා | 60% |

සටහන : විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේදී පුරප්පාඩු ගණනය කළ යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

I. අනුමත තනතුරු සංඛ්‍යාව 04 ක් වන විට සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 75% ක් විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03 ක් වන විට ඉහත සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% විය යුතුය.

II. විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 3 කට වඩා අඩු වේ නම් නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත තනතුරුවල පුරප්පාඩු පිරවීම සිදුකළ යුතුය.

10.3.2 සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගැනීම.

10.3.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහ (05) ම උපයාගෙන තිබීම.



ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: GOS/ADM/4/7/309.
දිනය: 2020.02.26

II.උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III.තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම.

10.3.2.2.බඳවා ගන්නා ආකාරය

බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරහ විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් අදාළ සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති බවට පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.
(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරහ විභාගය - උපලේඛනය 05)

සටහන : I. විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරහ විභාගයේ ප්‍රතිඵල අදාළ කරගත යුතු වන්නේ එම විභාගය අදාළ වන්නා වූ වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

II. වාර්ෂිකව එම විභාගය පැවැත්වීමට නොහැකි වූයේ නම් ඊට පසු වර්ෂයක පැවැත්වෙන විභාගයේ ප්‍රතිඵල එක් එක් වර්ෂවල පැවැති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අදාළ කර ගනු ලැබේ. එහිදී ඒ ඒ වර්ෂවල පුරප්පාඩු ගණනය කරනු ලබන වකවානුවට සුදුසුකම් ලැබූ නිලධරයන් ලකුණු අනුපිළිවෙල අනුව තෝරාගනු ලබන අතර විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය පැවැත්වූ දිනය වේ.

10.3.3 සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගැනීම.

10.3.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. .සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හයක (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම.

10.3.3.2 බඳවා ගන්නා ආකාරය

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත් කිරීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම, බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.
(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය -උපලේඛණය-06)

**11.** **තනතුරුවලට පත් කිරීම -** අදාල නොවේ.

**12.** **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කල යුතුය.

12.1 පරිවාස කාලය හා සේවය ස්ථිර කිරීම.

I. විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධරයෙකු වසර 3ක පරිවාස කාලයකට යටත්වේ. ඔහු /ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් ඔහු /ඇය පරිවාස කාලය අවසානයේ ස්ථිර කරනු ලැබේ.

II. සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා නිලධරයන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ලබන අතර ඔහු /ඇය වැඩ බැලීමේ කාලය තුල සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම්, වැඩ බැලීමේ කාලය අවසානයේදී සේවයේ ස්ථිර කරනු ලැබේ.

12.2 වෘත්තියමය සේවාවල කරනු ලබන උසස්වීම්

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ වෘත්තියමය සේවාවල සේවක සංඛ්‍යාවෙන් යම්කිසි ප්‍රතිශතයක් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරින්ගෙන් විභාගයකින් තෝරා ගනු ලබන අයගේ උසස්වීම සඳහා වෙන් කරයි.

12.3 රජය විසින් හෝ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ නිපුණතාවයන්ද සියළුම නිලධරයන් විසින් නියමිත පරිදි ලබා ගත යුතුය.

**13.** අර්ථ නිරූපන

**" සතුටුදායක සේවා කාලය"**

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මඟින්ද, සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මඟින්ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) සේවකයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩුකොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර 03ක කාලයක්ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.



ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය:..WP/ADM/4/7/309
දිනය:...2020. 02. 26

**" සක්‍රිය සේවා කාලය"**

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**" නියමිත දිනට"**

අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත්විය යුතු දිනය, " නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම් වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

**" ආධුනික නිලධාරියා "**

යනුවෙන් අදහස් කරනුයේ මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ. විධිවිධාන යටතේ බඳවා ගනු ලැබ පුහුණු කිරීමේ ශ්‍රේණියක සිටින පුද්ගලයෙකි.

**" බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය "**

යන්නෙන් අදහස් කරනුයේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය වේ.

**" ක්‍රියාත්මක වන දිනය"**

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් අංක 1930/12 හා 2015.09.01 දිනැති ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට සමගාමීව 2013 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන දිනය වේ.

**14. අන්තර්ග්‍රහණ විධිවිධාන :**

14.1 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති MN-03 2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධරයන් සියළුම දෙනා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.2 සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී විම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

14.3 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට සේවයේ නියුතු නිලධරයන් නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය යටතේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) තනතුරට අන්තර්ග්‍රහණය කිරීම පහත සඳහන් ආකාරයට සිදු කරනු ලැබේ.

14.3.1 තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.
මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (යාන්ත්‍රික) II වන පන්තිය (ආ) ඛණ්ඩයේ සිටින නිලධරයන්

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

14.3.2 තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) II වන පන්තිය (අ) ඛණ්ඩයේ සිටින නිලධරයන්

14.3.3 තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (යාන්ත්‍රික) I වන පන්තියේ සිටින නිලධරයන්

14.3.4 තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) විශේෂ ශ්‍රේණියේ සිටින නිලධරයන්

**15. අන්තර්කාලීන විධිවිධාන**

අන්තර් කාලීන විධිවිධාන 2018.06.01 දක්වා බල පැවැත්වේ. මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට III වන හා II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධාරීන්ට උසස්වීම් ලබාදීමේදී අන්තර්කාලය තුළදී අදාළ කරගත යුත්තේ මීට පෙර අනුමත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවල අදාල වගන්ති වේ.(අනෙකුත් කොන්දේසි මෙමම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව වේ.)

**16. වෙනත්:**

16.1 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16.2 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධ ගැටළු පැන නගින අවස්ථාවකදී හා/හෝ මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

සකස් කලේ .......[signature]....... 19.11.25
(විෂයභාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ඒ. කේ. පී. එම්. මෛත්‍රීරත්න
තනතුර : පරිපාලන නිලධාරි, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
දිනය : ..........

පරීක්ෂා කලේ : .......[signature] 2019/11/28.......
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : පී. කේ. සී. කුලරත්න
තනතුර: නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත
දිනය : ..........

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : .......[signature].......
නම : කසුන් ඈපා සෙනෙවිරත්න
තනතුර : පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
දිනය : 2019.12.02

යොමු අංකය : CMWP/APM10/01/1-68

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2019.12.5

අත්සන : .......[signature].......
නම : චන්ද්‍රානි සමරකෝන්
ලේකම්
පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.)
නිල මුද්‍රාව
පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, නිවාස ඉදිකිරීම්, ජලසම්පාදන හා ප්‍රවාහන හා සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
යොමු අංකය: WP/ADM/4/7/309
දිනය: 2020.02.26

යොමු අංකය : ..........................................

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය ..........................................

අත්සන : ..........................................

නම :..........................................

ප්‍රධාන ලේකම් (බ.ප.)

නිල මුද්‍රාව

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

යොමු අංකය : ..........................................

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය : ..........................................

අත්සන : ..........................................

නම: ..........................................

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.)

නිල මුද්‍රාව

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය : ..........................................

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය .................... දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

අත්සන : ..........................................

නම : ..........................................

ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

නිල මුද්‍රාව

දිනය : ..........................................

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
යොමු අංකය: ..........................................
දිනය: ..........................................

උපලේඛනය 01

1. විභාගයේ නම : බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) තනතුරේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණය
2. විභාගය පිළිබඳ විස්තර :

පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ 111 වන ශ්‍රේණිය සඳහා

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය අනුව පවත්වනු ලැබේ.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත් සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | වාහන යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම සම්බන්ධ මූලධර්ම, වාහන හා සම්බන්ධ පද්ධතීන් සම්බන්ධ දැනුම, ලෝහ කර්මාන්ත හා ලෝහවල ලක්ෂණ,එන්ජින් සිසිලන කාරක පිළිබඳ දැනුම, මිනුම් උපකරණ භාවිතය, යන්ත්‍ර ආයුධ,කපන ආයුධ දැනුම නිර්මාණාත්මක යන්ත්‍රෝපකරණ හා යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම පිළිබඳව දැනුම හා අපේක්ෂකයා අත්පත් කර ගත යුතු හැකියාවන් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: ගප/ADM/4/7/309
දිනය: 2020.02.26

අත්සන : ..............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය :

නිල මුද්‍රාව :

කසුන් ඇසා සෙනෙවිරත්න
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

2019.12.02

උපලේඛනය 02

1. විභාගයේ නම :බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) පුහුණු ශ්‍රේණියට බඳවාගත් නිලධාරීන් III ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) පුහුණු ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන විභාගය | පැය 03 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : පත්වීම් බලධරයා .හෝ බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: අවශ්‍යතාවය අනුව වසරකට එක් වරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

- ද්වි පහර සහ සිව්පහර එන්ජින්වල ක්‍රියාකාරීත්වය හා දෝෂ හඳුනා ගැනීම, අදාල අලුත්වැඩියාවන් කිරීම
- ගියර පෙට්ටි සහ තිරිංග පද්ධති පිළිබඳ දැනුම
- යන්ත්‍රවල ද්‍රාව පද්ධති පිළිබඳ දැනුම
- වාහන විදුලි බැටරියේ නඩත්තුව, විදුලි පද්ධතියේ විලායක සවි කිරීම පිළිබඳ දැනුම
- එන්ජින් සිසිලන කාරක පිළිබහඳ දැනුම
- ලෝහවල යාන්ත්‍රික ගති ලක්ෂණ පිළිබඳ දැනුම
- ලෝහවල පැසුරුම් ලක්ෂණ පිළිබඳ දැනුම
- මිනුම් උපකරණ භාවිතය - කෝදුව, ආමාන වර්ග සහ කැලිපරය (වර්නියර් කැලිපරය, මයික්‍රො මීටරය)
- යන්ත්‍ර ආයුධ හා කපන ආයුධ කෝණ (Tool Angle)
- ලියවන පට්ටල මගින් පොට කැපීම
- මිලිං යන්ත්‍රය මගින් ගියර කැපීම
- ගිනිගල් යන්ත්‍රවල රෝද නිපදවීම හා භාවිතය
- ගිනිගල් රෝදවල හැඩතල පිළිබඳ දැනුම හා කැපුම් වේග නිර්ණය කිරීම
- වානේ රත්කරන විට හැසිරීම හා රත් පිළියම් කිරීම
- තිරස් හා සිරස් ගාන පට්ටලවල සීරු මාරු කිරීම්
- වාත්තු කර්මාන්තය පිළිබඳ දැනුම
- යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම

අත්සන : ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :
තනතුර : කසුන් ඇපා සෙනෙවිරත්න
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
දිනය :
නිල මුද්‍රාව : 2019.12.02

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

උපලේඛනය 03

01. විභාගයේ නම : බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :

බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ VIII,XII,XIII,XIV,XIX පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | I වැනි පරිච්ඡේද මුදල් රෙගුලාසි 01 සිට 68 දක්වා<br>III වැනි පරිච්ඡේද මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා |

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................................

තනතුර : ..........................................

කසුන් ඇපා සෙනෙවිරත්න
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

දිනය : ..........................................

නිල මුද්‍රාව : ..........................................

2019.12.02

ශ්‍රී ලංකා ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී
ගොනු අංකය: ගආප/ADM/4/7/307
දිනය: 2020.02.26

උපලේඛනය 04

01. විභාගයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ XV, XVI ,XXIII, XXIV, XXV, XXVII XXVIII , XXX, XXXIII, XLVII, XLVIII වන පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | VI පරිච්ඡේද මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා<br>XIII පරිච්ඡේද මුදල් රෙගුලාසි 685 සිට 775 දක්වා |

අත්සන : ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................................

තනතුර : ..........................................
කසුන් ඇපා සෙනෙවිරත්න
පළාත් පාලන කොමසාරිස්

දිනය : ..........................................
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

නිල මුද්‍රාව : ..........................................

2019.12.02

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: GOS/ADM/4/7/309
දිනය: 2020.02.26

උපලේඛණය 05

01.විභාගයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| කළමනාකරණය | පැය 03 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :

අවශ්‍යතාවය පරිදි වර්ෂයකට එක් වරක්

05. විභාගය සඳහා විෂය නිර්දේශය.

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | I. කළමනාකරණ මූලධර්ම<br>II. කළමනාකරණ ශ්‍රිතයන්<br>සැලසුම් කිරීම<br>තීරණ ගැනීම<br>තීරණ ගැනීමේ ක්‍රියාවලිය<br>සංවිධානය<br>මාණ්ඩලීකරණය<br>මෙහෙයවීම<br>අභිප්‍රේරණ ක්‍රියාවලිය<br>නායකත්වය<br>පාලනය<br>පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය<br>III සහභාගිත්ව කළමනාකරණය<br>IV කළමනාකරණ පරිසරය<br>V සිද්ධි අධ්‍යයනය |
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |

අත්සන : ...........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ...........................................

තනතුර : ...........................................

දිනය : ...........................................

නිල මුද්‍රාව : ...........................................

කසුන් ඇපා සෙනෙවිරත්න
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

2019 . 12 . 02

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: ගපාස/ADM/4/7/309
දිනය: 2020 . 02 . 26

උපලේඛණය 06

01. විභාගයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි(යාන්ත්‍රික) I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| සේවා පළපුරුද්ද<br>I වන ශ්‍රේණියේ වසර හයක(06) සේවයට අමතරව ඇති සේවාව වෙනුවෙන් එක් අමතර වසරක් සඳහා ලකුණු 05 බැගින් ලබා දේ. | 50 | 50 | අදාළ නොවේ. |
| කුසලතාවය<br>කාර්ය සාධනය (ආසන්න වසර 5 සඳහා) -15<br>විශිෂ්ඨ මට්ටම - 03<br>සාමාන්‍ය ප්‍රමාණනයට වඩා ඉහල - 02<br>සතුටුදායක මට්ටම - 01 | 15 | 45 | |
| වෘත්තීය සුදුසුකම් - 05<br>යාන්ත්‍රික ක්ෂේත්‍රයට අදාලව,<br>• මාස 06 ක් හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලා සහතිකයක් සඳහා - 05<br>• මාස 06 ට අඩු ඩිප්ලෝමා පාඨමාලා සහතිකයක් සඳහා - 03 | 05 | | |
| තොරතුරු තාක්ෂණ පාඨමාලා / පරිගණක පාඨමාලා සහතිකයක් සඳහා - 02 | 02 | | |
| ව්‍යාපෘතියක් / ව්‍යාපෘති සාර්ථකව ඉටු කර ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිත වාර්තාමය ඉදිරිපත් කිරීමක් (ඉටු කිරීමේදී පැවති ගැටළු, ඒවාට ලබා දුන් විසඳුම් ඇතුලත් විය යුතුය.) | 15 | | |
| යාන්ත්‍රික ඉදිකිරීම් හා නඩත්තු සේවා කටයුතු ඉටු කිරීමේදී දක්වන සක්‍රිය දායකත්වය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ආයතන ප්‍රධානියාගේ සහතිකය | 06 | | |



ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: WP/PSC/ADM/4/7/309
දිනය: 2020-02-26

| | | | |
|---|---|---|---|
| ප්‍රශංසා හා ඇගයීම් | 02 | | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | 05 | |
| එකතුව | 100 | 100 | |

03. සම්මුඛ පරීක්ෂණය සඳහා පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :

වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................................

තනතුර : ..........................................

දිනය : ..........................................

නිල මුද්‍රාව : ..........................................

කසුන් ඇපා සෙනෙවිරත්න
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

2019.12.02

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: ගආ/ADM/4/7/309
දිනය: 2020.02.26

| අනු අංකය | ආයතනයේ නම | තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) III /II / I ශ්‍රේණි අනුමත තනතුරු සංඛ්‍යාව | තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) විශේෂ ශ්‍රේණි අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කොළඹ මහ නගර සභාව | 32 | 02 |
| 02 | දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව | 02 | |
| 03 | මොරටුව මහ නගර සභාව | 02 | |
| 04 | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ම.න.ස. | 01 | |
| 05 | කඩුවෙල මහ නගර සභාව | 01 | |
| 06 | ගම්පහ මහ නගර සභාව | 01 | |
| 07 | මීගමුව මහ නගර සභාව | 01 | |
| 08 | මහරගම නගර සභාව | 01 | |
| 09 | අත්තනගල්ල ප්‍රාදේශීය සභාව | 01 | |
| 10 | ජා ඇල ප්‍රාදේශීය සභාව | 01 | |
| | එකතුව | 43 | 02 |

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: GOS|ADM|4|7|309
දිනය: 2020.02.26

ඇමුණුම - II

## ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම් පත්‍රය

1. නිලධරයා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ....................................................................................

1.2 හැඳුනුම්පත් අංකය : ....................................................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ....................................................................................

1.4 අයත් වන ශ්‍රේණිය හා තනතුර : ....................................................................................

1.5 අයත් වන සේවා ගණය හා ශ්‍රේණිය : ....................................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්වීම් දිනය :....................................................................................

2.2 පත්වීම ස්ථිර කල දිනය :....................................................................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| | | |
|---|---|---|
| | | |
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I / විශේෂ

3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද ? ඔව් / නැත

3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ....................................................

4. <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම සඳහන් .................................... ................................................................. මහතා/ මෙනවිය / මහත්මිය ................................ සේවා ගණයේ ................................ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත්වෙමි. ඒ අනුව බඑම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ........................................................

අත්සන : ........................................................

දිනය : ........................................................

නිල මුද්‍රාව :........................................................

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: GOS/ADM/4/7/3.09
දිනය: 2020.02.26

5. <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් දක්වා ඇති කරුණු නිවැරදි බවත්/ නිවැරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

නම : ..........................................................

අත්සන :..........................................................

දිනය :..........................................................

නිල මුද්‍රාව : ..........................................................

6. <u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් / පත්වීම් බලධරයා</u>

ඉහත සදහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව .................................. මහතා/ මහත්මිය/ මෙනවිය ...............................................සේවා ගණයේ ..............................ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ ....................................... දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ......................................................

අත්සන : ......................................................

දිනය : ......................................................

නිල මුද්‍රාව : ......................................................

ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය:......GOS/ADM/4/7/309
දිනය:......2020.02.26